Matugama Education Zone මත්තුගම කල්වික් වලයම් මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| භූගෝල විද්‍යාව | 11 ශ්‍රේණිය | කාලය : පැය 01යි |
|---|---|---|

## I <u>පත්‍රය</u>

- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40කින් සමන්විත ය.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුව සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

1. උෂ්ණත්වය උන්නතාංශය සමග ක්‍රමයෙන් පහළයාම දක්නට ලැබෙන්නේ ............................ ගෝලයේය. (පරිවර්ති, අපරිවර්ති, මෙසෝ)
2. පෘථිවි කබොල ප්‍රාවරනයෙන් වෙන්වන සීමාව.................................. නමින් හැඳින් වේ. (ගුටෙන්බර්ග් ආසන්තතිය, පහල ප්‍රාවරනය, මොහොරෝවිසික් ආසන්තතිය)
3. මින්ඩානාඕ හා මරියානා ආගාධ පිහිටා ඇත්තේ...................................... සාගරයේ ය. (අත්ලාන්තික්, පැසිපික්, ඉන්දියන්)
4. ලොව උසම ස්ථානයක පිහිටි විල ................................ නම් වේ. (බයිකල්, ටිටිකාකා, සුපිරියර්)
5. බෝර්නියෝ. ජාවා, සුමාත්‍රා යන දූපත් ......................................... මහාද්වීප තටකය තුළ පිහිටා ඇත. (ආසියා, අප්‍රිකා, ඕස්ට්‍රේලියා)
6. සම්පූර්ණයෙන්ම ගොඩබිමින් වට වූ මුහුදකි ..................................... (රතු මුහුද, කැස්පියන් මුහුද, අරාබි මුහුද)
7. ශ්‍රී ලංකාව පිහිටා ඇත්තේ............................................භූමිය තුළ ය. (යුරේෂියානු, අප්‍රිකානු, ඉන්දු ඕස්ට්‍රේලියානු)
8. ලෝකයේ දේශගුණ ව්‍යාප්තිය පිළිබඳ මුල්ම අදහස ඉදිරිපත් කරනු ලැබුවේ ..................................... විසිනි. (කෙපන්, ඔස්ටින් මිලර්, ඇරිස්ටෝටල්)
9. නිවර්තන වනාන්තර දක්නට ලැබෙන රටකි............................ (ඇලස්කාව, බ්‍රසිලය, ඉතාලිය)
10. කහටගහ, කොලොන්ගහ, මිනිරන් පතල් අයත් වන්නේ .................................. දිස්ත්‍රික්කයට ය. (රත්නපුර, කුරුණෑගල, කෑගල්ල)

- ප්‍රශ්න අංක 11 – 20 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ කියවා නිවැරදි නම් (නි) යන්න වටා ද වැරදි නම් (වැ) යන්න වටා ද රවුමක් අඳින්න.

11. ඕසෝන් ස්තරය පිහිටා ඇත්තේ පරිවර්තිගෝලය තුළ ය. (නි/වැ)
12. ශ්‍රී ලංකාවේ ජල උල්පත් පෝෂණය වන්නේ වර්ෂාපතනය මගිනි. (නි/වැ)
13. හුණුගල් නැමති පාෂාණ වර්ගය සිමෙන්ති සෑදීමට යොදා ගනී. (නි/වැ)
14. ගංගා, ඇළ දොළ හිම ප්‍රදේශවල ඇති ජලය භූගත ජලය වේ. (නි/වැ)
15. ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශය වෙරළ සීමාවේ සිට නාවික සැතපුම් 16ක් වේ. (නි/වැ)
16. සියල්ල ස්ථරය යනු පෘථිවියේ තැනින් තැන පිහිටි සාගරය. (නි/වැ)
17. පෘථිවි අභ්‍යන්තරයේ ඇති මැග්මා සිසිල්වීමෙන් ආග්නේය පාෂාණ සෑදේ. (නි/වැ)
18. ලොව විශාලතම තැනිතලාව වන්නේ නල්ලබාර්තැන්නයි. (නි/වැ)
19. කඳුකර ප්‍රදේශයක පිහිටි උසම භූමි ප්‍රදේශය සානු ලෙස හැඳින්වේ. (නි/වැ)
20. පෘථිවි ජල ව්‍යාප්තියෙන් 95.5% මිරිදිය වේ. (නි/වැ)

- ප්‍රශ්න අංක 21-30 දක්වා ප්‍රශ්නවල දී ඇති හිස්තැනට සුදුසු හිස්තැන යොදා සම්පූර්ණ කරන්න.

21. මහද්වීපයක මායිමක සිට සාගරය දෙසට පැතිරී ගිය නොගැඹුරු මුහුදු තීරය ........................... නමින් හැඳින්වේ.
22. තේ පර්යේෂණායතනය පිහිටි නගරය වන්නේ .................................... වේ.
23. ආසියාවේ පිහිටි .............................. සානුව ලෝකයේ උසින්ම පිහිටි සානුවයි.
24. ලෝක ජන සංඛ්‍යාවෙන් හරි අඩක් ජීවත් වන්නේ ....................... මහද්වීපයේය.
25. ........................................ දෙපාර්තමේන්තුව 1980 දශකයේ මුල් භාගයේදී මෙට්‍රික් මිනුම්වලින් යුතු සිතියමක් සකස් කරන ලදී.
26. රතු මුහුද හා මධ්‍යදරණි මුහුද සම්බන්ධ වන්නේ ............................... ඇළ මගිනි.
27. රත්න, මිද්දෙනිය, තංගල්ල සම්බන්ධ කරන ප්‍රදේශය ........................... නමිනි
28. ලංකාවේ 1:50000 භූ ලක්ෂණ සිතියම්වල සැබෑ දුර කි. මී. 1ක් සිතියමේ දැක්වෙන්නේ ....................... මගිනි.
29. ඓන්ද්‍රීය ද්‍රව්‍ය දියවීම නිසා .................................... නිර්මාණය වේ.
30. සියලු ම වායුගෝලීය සංසිද්ධීන් ක්‍රියාත්මක වන්නේ ................................ ගෝලයේ ය.

- ප්‍රශ්න අංක 31 - 37 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුර අතරින් වඩා ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

31. බොරලැස්ගමුව, මීටියාගොඩ, රත්තොට යන ප්‍රදේශවල බහුලව ඇති ඛණිජ වර්ගය,

| | | | |
|---|---|---|---|
| i | උළු ගඩොල් | iii | මිනිරන් |
| ii | බෝල මැටි | iv | පිගන් මැටි |

32. සුළු අපනයන භෝග පර්යේෂණායතනය පිහිටා ඇත්තේ,

| | | | |
|---|---|---|---|
| i | අගලවත්ත | iii | බෝම්බුවල |
| ii | තලවකැලේ | iv | මාතලේ |

33. 1:50000 සිතියම් කොටසකින් නිරූපිත භූමියේ විශාලත්වය වන්වේ,

| | | | |
|---|---|---|---|
| i | ව.ක්‍රි.මී 750කි | iii | ව.ක්‍රි.මී 500කි |
| ii | ව.ක්‍රි.මී 1000කි | iv | ව.ක්‍රි.මී 2000 |

34. මහාබාධක කඳු පිහිටියේ,

| | | | |
|---|---|---|---|
| i | අප්‍රිකාවේය | iii | ඕස්ට්‍රේලියාවේය |
| ii | ඉන්දියාවේය | iv | උතුරු ඇමරිකාවේය |

35. පහත දැක්වෙන ඒවායෙන් කවරක් විපරීත පාෂාණවලට අයත් වේ ද?

| | | | |
|---|---|---|---|
| i | දියමන්ති | iii | ජිප්සන් |
| ii | ග්‍රැනයිට් | iv | ගල්අඟුරු |

36. ලෝකයේ මිලියන නගරවලින් වැඩි සංඛ්‍යාවක් ව්‍යාප්තව ඇත්තේ,

| | | | |
|---|---|---|---|
| i | උතුරු ඇමරිකාවේය | iii | අප්‍රිකාවේය |
| ii | යුරෝපයේය | iv | ආසියාවේය |

37. ආසියා මහාද්වීපයට අයත් කඳුවැටියක්, ගංගාවක් හා විලක් දැක්වෙන්නේ කුමන පිළිතුරේ ද?

| | | | |
|---|---|---|---|
| i | හිමාලය, සින්ධු බයිකල් | iii | අට්ලස්, රයින්, මිචිගන් |
| ii | රොකී, නයිල්, ටිටිකකා | iv | මහාබාධක, මරේඩාලින්, අයර් |

38. ලෝකයේ දේශගුණය පිළිබඳ මුලින්ම අදහසක් ඉදිරිපත් කල පුද්ගලයා වන්නේ,

| | | | |
|---|---|---|---|
| i | කෙපන් | iii | ඇරිස්ටෝටල් |
| ii | මිලර් | iv | තෝර්න්වෙට් |

39. හෙල් මළු වී වගාව යනුවෙන් හැඳින්වෙන්නේ,

- i කඳු මුදුන්වල කරන වී වගාවයි
- ii කඳු බෑවුම් පඩිපෙළි ආකාරයට සාදා කරන වගාවන්ය
- iii කඳුකර ප්‍රදේශ තැනිතලා බවට පත් කොට කරන වගාවන්ය
- iv කඳු පාමුල කරන වගාවන්ය

40. ලංකාවෙන් තේ මිලදී ගන්නා ප්‍රධාන කලාපය,

| | | | |
|---|---|---|---|
| i | යුරෝපා කලාපයයි | iii | ආසියාතික කලාපයයි |
| ii | මැදපෙරදිග කලාපයයි | iv | ලතින් ඇමරිකා කලාපයයි |

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| භූගෝල විද්‍යාව | **11 ශ්‍රේණිය** | **කාලය : පැය 02යි** |
|---|---|---|

## II පත්‍රය

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. අ, ආ හා ඉ යනුවෙන් කොටස් තුනකි . පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 4 කටත් පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගනණ 5කි.

1) (අ)

1. 1:50000 භූ ලක්ෂණ සිතියම්වල පහත දැක්වෙන දෑ නිරූපනය සඳහා භාවිතා කරනු ලබන වර්ණ හා සංකේත ඉදිරියෙන් ලියන්න .
   - i. ප්‍රධාන මාර්ගය
   - ii. පළාත් මායිම
   - iii. පොලීසිය
   - iv. වෙනත් වගා
   - v. වාරි මාර්ග ඇළ
2. 1:50000 සිතියමක රේඛීය පරිමානය ඇඳ දක්වන්න .
3. කි.මී 4ක් දිග ගංගාවක් ඉහත පරිමානයට සිතියම් ගත කරන විට ගංගාවේ දිග කොපමණ වේ ද?
4. 1:50000 භූ ලක්ෂණ සිතියම්වල මුහුණත දැකිය හැකි භෞතික ලක්ෂණ 2 ක් හා සංස්කෘතික ලක්ෂණ 2 ක් නම් කරන්න.

(ආ) සපයා ඇති ලංකා ආකෘති සිතියමක පහත දැක්වෙන දෑ ලකුණු කොට නම් කරන්න,

- i. යාල අභය භූමිය
- ii. දෙවුන්දර තුඩුව
- iii. නුවරඑළිය දිස්ත්‍රික්කය
- iv. වළවේ ගඟ
- v. පොලොන්නරුව

(ඉ) සපයා ඇති ලෝක ආකෘති සිතියමක පහත සඳහන් දෑ ලකුණු කොට නම් කරන්න.

- i. පැනමා ඇළ
- ii. අන්දිස් කඳු
- iii. නයිල් ගඟ
- iv. නල්ලබාර් තැන්න
- v. බයිකල් විල

2)

i. ඍජීවී පද්ධතිය සමන්විත වන උප පද්ධති 4 නම් කරන්න.
ii. පරිවර්තීගෝලය තුළ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ 3ක් නම් කරන්න.
iii. ජෛව ගෝලයේ සීමා මායිම් නම් කර එහි පැවැත්ම කෙරෙහි මානුෂ ක්‍රියාකාරකම් බලපාන ආකාරය විස්තර කරන්න.

3)

i. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ ප්‍රධාන අංශ 3 නම් කරන්න.
ii. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සඳහා හිතකර සාධක මොනවාද ?
iii. මෙරට ධිවර කර්මාන්තය දියුණු කිරිමට රජය ගෙන ඇති පියවරවල් මොනවාද?

4)

i. ලෝකයේ කපුපිළි කර්මාන්තයේ නියුතු රටවල් හතරක් නම් කරන්න.
ii. කපු පිළි කර්මාන්තයේ ලක්ෂණ හා ප්‍රවනතා දෙක බැගින් ලියන්න.
iii. කපු රෙදි සඳහා නිවර්තන රටවලින් ඉහළ ඉල්ලුමක් ඇති විමට හේතු දෙකක් පැහැදිලි කරන්න .

5) ශ්‍රී ලංකාවේ ස්වභාවික වාක්ෂලතා කලාප ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ලංකාවේ ස්වභාවික වෘක්ෂලතා කලාප නම් කරන්න.
ii. A ලෙස නම් කර ඇති වෘක්ෂ ලතාවල හඳුනාගත හැකි ලක්ෂණ 3ක් ලියන්න.
iii. වන සම්පත විනාශ විම නිසා අනාගතයේ දී ඇතිවිය හැකි පාරිසරික ගැටළු 3ක් පැහැදිලි කරන්න.

6)

i. ප්‍රධාන පාෂාණ වර්ග තුනක් නම් කරන්න.
ii. ශ්‍රී ලංකාවේ බහුල ලෙස ව්‍යාප්ත වි ඇති ඛනිජ වර්ග තුනක් නම් කරන්න .
iii. අවසාධිත පාෂාණවල ආර්ථික වැදගත්කම පැහැදිලි කරන්න.

7)

i. ලෝක ජන සංඛ්‍යාවේ ව්‍යාප්තිය අනුව ජනාධික කලාප දෙකක් නම් කරන්න .
ii. ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තියට බලපාන සාධක තුනක් විස්තර කරන්න.
iii. ලෝකයේ අධික ජන සංකේන්ද්‍රණ හතර ආශ්‍රිතව ඇති මිලියන නගර 1 බැගින් නම් කරන්න.